museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2023 ජූනි

# ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයෙහි මහජන වැඩසටහන්

කෞතුකාගාරවල මහජන වැඩසටහන්, ප්‍රදර්ශන සහ ගැලරි අවකාශ තුළ ලැබෙන දේට ප්‍රතිචාර ලෙස සැකසුණු නිර්මාණාත්මක, විමර්ශක, හා විනෝදාත්මක ක්‍රියාකාරකම්වල නියැලීමට අමුත්තන්ට ඇරයුම්කරන අතරේපොදු ජනතාවට සංචාරවලින් එහා ගිය කෞතුකාගාර අත්දැකීම් ද ලබාදෙයි. 2019 දෙසැම්බර් විවෘතකළ ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා), එහි ආරම්භයේ සිට ම අමුත්තන් සඳහා මහජන වැඩසටහන් සංවිධානයකර ඇත. ප්‍රදර්ශිත කලාකෘති සමඟ මහජනතාව සම්බන්ධකිරීමේ ප්‍රයත්නවල කොටසක් ලෙස කෞතුකාගාරයේ ප්‍රදර්ශන සමඟ අභිරක්ෂණකර ඇති මෙම නොමිලේ පැවැත්වෙන වැඩසටහන්, සහභාගිවන්නන්ට අධ්‍යාපන හා විනෝදාත්මක අවස්ථා ලබාදීම අරමුණුකරයි.

කෞතුකාගාරයේ මහජන වැඩසටහන්වලට ගැලරි කතා, වැඩමුළු, ප්‍රසංග, කවි කියවීම්, අභිරක්ෂක සංචාර, ප්‍රදර්ශන සංචාර, ප්‍රහේලිකා දින හා තවත් දෑ ඇතුළත් වේ. ඒවා කලාවට සබැඳි අධ්‍යාපනය ලැබීමටත්, කලාවට සහ සංස්කෘතියට සම්බන්ධ සමාජ-සංස්කෘතික සහ දේශපාලන කතිකා පිළිබඳ දැනුම අත්පත් කරගැනීමටත්, රටේ ප්‍රථම නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ ප්‍රමෝධජනක සන්දර්භය විඳගැනීමටත් මහජනතාවට අවස්ථා සපයයි.

MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා පැවසුවේ, “අපේ මහජන වැඩසටහන් නොමිලේ පැවැත්වෙනවා වගේ ම, නූතන හා සමකාලීන කලාවට වැඩි ප්‍රවේශයක් ලබාදීම අරමුණුකරගෙන සැකසී ඇත්තේ එහි වාණිජමය වටිනාකමට අමතරව අප ජීවත්වන සමාජ පිළිබඳව ආවර්ජනා කිරීමට උපකාරයක්වන නිසයි. නූතන හා සමකාලීන කලාව සමහරක් නරඹන්නන්ට අවුල්සහගත විය හැකි බව අපට වැටහෙනවා. අපේ මහජන වැඩසටහන් ඉතාමත් වැදගත් වෙන්නේ ඒ නිසයි.” පෙරේරා වැඩිදුරටත් පැවසුවේ, “අපි සැලසුම්කර ඇති ස්ථිර ස්ථානය වෙනුවෙන් නරඹන්නන් එකතුකරගැනීම මෙම අභ්‍යාසයේ කොටසක්වන අතර, අපේ ආරම්භයේ සිට නරඹන්නන් ප්‍රජාව පුළුල්වී වැඩිවන ආකාරය අපි දැක තිබෙනවා” යන්නයි.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

MMCA ශ්‍රී ලංකා විසින් නොමිලේ පවත්වන මහජන වැඩසටහන් එහි අධ්‍යාපනය අංශය විසින් මෙහෙයවන අතර, අධ්‍යාපන හා මහජන වැඩසටහන් සහාය අභිරක්ෂක ප්‍රමෝදා වීරසේකර විසින් අභිරක්ෂණයකරෙයි. වීරසේකර පැවසුවේ, "බොහෝ විට අපේ ප්‍රදර්ශන තේමා වටා දිවෙන මෙම වැඩසටහන්, සෑම නරඹන්නෙක් සඳහා ම ඉගෙනුම් අත්දැකීම් වෙනවා. අපේ අරමුණ වෙන්නේ වැඩසටහනකට සහභාගීවන හැමදෙනා ම ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලාව, එයට සම්බන්ධ තේමා, කතිකා, කුසලතා, හා තවත් දෑ පිළිබඳව මනා අවබෝධයකින් හා දැනුවත්වීමකින් පිටවයාමයි." ඇය තවදුරටත් කියා සිටියේ, "අප සමඟ මහජන වැඩසටහන් සම්බන්ධයෙන් කටයුතුකරන සම්පත් දායකයින් කලාව පිළිබඳව සංවේදීතාවයක් ඇති ප්‍රවීනයන්වන අතර, එවැනි පුද්ගලයන් 100කට වැඩි පිරිසක් සමඟ වැඩකිරීමට ලැබීම ගැන අපි කෘතඥ වෙනවා" යනුවෙනි.

කොළඹ 3, ක්‍රෙස්කැට් බූලෙවාඩ්හි බිම් මහලේ පිහිටි කෞතුකාගාර පරිශ්‍රයේ 2023 ඔක්තෝම්බර් 22 දක්වා පැවැත්වෙන 'ආගන්තුකයෝ' යන නව ප්‍රදර්ශනය සමඟ නොමිලේ පැවැත්වෙන, අලුත් හා ආකර්ෂණීය මහජන වැඩසටහන් රාශියක් නරඹන්නන් සඳහා සූදානම්ව ඇත. 'ආගන්තුකයෝ' යනු විදේශිකයන්, පිටස්තරයන්, හෝ අතිචාරීන් යැයි කියා ආගන්තුකබව ඔවුන් මත සලකුණුකර ඇති විකාරරූපී ආකාර ආමන්ත්‍රණයකිරීමට විවිධ මාධ්‍ය භාවිතකරන සමකාලීන කලාකරුවන් 15 දෙනෙකුගේ කලාකෘති එකට එක්කිරීමකි. 'ආගන්තුකයෝ' සමග ඇති මහජන වැඩසටහන් අතරට, කලාකරුවන් සහ කලාකෘති සම්බන්ධ අදහස් හා විෂයයන්හි ප්‍රවීණයන් සමඟ කෙරෙන ගැලරි කතා, ප්‍රසංග ,වැඩමුළු, හා තවත් දේ ඇතුළත් වේ. ප්‍රදර්ශිත කලාකෘතිවලට සමගාමීව සාහිත්‍ය කෘති විචාරය කිරීම අරමුණුකරගත් නව 'කියවීම් කණ්ඩායම්' මාලාවක් ද වැඩසටහන්කරණය තුළ හඳුන්වාදෙනු ඇත.

සියලු ම මහජන වැඩසටහන් යුරෝපා සංගමයේ නිර්ලෝභී සහයෙන් සිදුකෙරෙන අතර, 'ආගන්තුකයෝ' ප්‍රදර්ශනය සඳහා අනෝජි අමරසිංහ, හියු මර්ෂාන්, රධිකා චොප්රා, සහ රාජන් ආනන්දන්ගේ කාරුණික සහයෝගය මෙන් ම MMCA ශ්‍රී ලංකාහි ආදිකර්තෘ අනුග්‍රාහකයන්ගේ, බ්‍රිතාන්‍ය කවුන්සිලයේ, සහ Lite87හි අමතර සහයෝගය ද ලැබෙයි. කෞතුකාගාරයේ ප්‍රධාන පරිත්‍යාගශීලීන් සහ අරමුදල් සපයන්නන්වන ජෝන් කීල්ස් පදනම, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, සහ ෆෙයාෆැස්ට් රක්ෂණ ආයතනය ද ඔවුන්ගේ නිර්ලෝභී සහයෝගය ලබාදෙයි.

කෞතුකාගාරය දිනපතා (පෝය සහ මහජන නිවාඩු දිනවල හැර) පෙ.ව. 10– ප.ව. 6 දක්වා කොළඹ 03, ක්‍රෙස්කැට් බූලෙවාර්ඩ්හි බිම් මහලේ විවෘතව ඇති අතර, කෞතුකාගාරයට ඇතුළුවීම සහ එහි සියලු ම මහජන වැඩසටහන් නොමිලේ ය. කෞතුකාගාරය සහ, එහි ප්‍රදර්ශන හා මහජන වැඩසටහන් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ වෙබ් අඩවියෙන් www.mmca-srilanka.org/ හෝ

ෆේස්බුක් facebook.com/mmcasrilanka සහ ඉන්ස්ටග්‍රෑම් instagram.com/mmcasrilanka/ පිටුවලින් ලබාගත හැක.